**ඇඹිලිපිටිය නගර සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල රු. 2,658,600 ක් ගෙවා මිලට ගත් ට්‍රැක්ටර් දෙකක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මිලටගත් වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ඊලඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොළිය රු. 714,769 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී අදාල පොළිය ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

### 1.4 අනුකූල නොවීම
-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**
----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(අ) මුදල් රෙගුලාසි | 2007 සිට 2018 දක්වා අවස්ථා 13 ක දී ලබාදී තිබුණු රු. 1,082,291 ක් වූ අතුරු අග්‍රිම පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරමින් පවතී. |

371(2)(ඇ)

| | | | |
|---|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 571 | 2012 සිට 2015 දක්වා එකතුව රු. 574,629 ක් වූ මිශ්‍ර තැන්පත්, ටෙන්ඩර් ඇප, සියයට 10 රඳවුම් හා කර්මාන්ත ගිවිසුම් ඇප සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 25,500,993 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 36,526,973 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,056,000 | 17,749,272 | 17,749,272 | 41,072,688 | 18,206,000 | 18,329,258 | 16,053,437 | 37,300,469 |
| (ii) | කුලී | 14,252,200 | 15,312,341 | 15,312,344 | 8,270,985 | 14,199,900 | 14,467,062 | 12,977,626 | 10,749,251 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,022,800 | 2,523,479 | 2,523,479 | - | 1,777,800 | 2,303,439 | 2,052,639 | - |
| (iv) | වෙනත් ආදායම් | 11,019,700 | 13,285,992 | 13,285,992 | 7,497,459 | 6,388,200 | 19,160,471 | 14,510,896 | 14,064,980 |

#### 2.2.2 වෙනත් ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ත්‍රීරෝද රථ 1,426 කින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු ත්‍රීරෝද රථ නැවතුම් ගාස්තු රු. 63,000 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් ත්‍රීරෝද රථ සංගමයේ සභාපතිතුමන් වෙත ලිඛිතව දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අයවැය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේදී ඇඹිලිපිටිය නගරය තුල රථ වාහන නවතා තැබීමේ ගාස්තු වශයෙන් රු. 250,800 ක් රැස් කර ගැනීමට සැලසුම් කර තිබුණද, එහි ටෙන්ඩරය කිසිවෙකුත් ලබාගෙන නොතිබීමෙන් එම ආදායම අහිමි වී තිබුණි. | සභාව වෙත ලැබිය යුතු ආදායම් අයකර ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා රථ වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳ වුවද, කිසිවෙකුත් ඉදිරිපත් වී නොතිබුණි. නගර සභාව සතු මානව සම්පත් ප්‍රමාණය සීමිත බැවින් එම මුදල් රැස්කර ගැනීමට කටයුතු කළ නොහැකි විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

| විගණන නිරීක්ෂණය ---- | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක නිවැරදිව හඳුනාගෙන දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම උදෙසා වන 2019 සිට 2022 දක්වා වූ දිගුකාලීන සැලසුම 2019 පෙබරවාරි 22 දින මහා සභාවේ අනුමත වී ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කල යුතු වුවත්, 2012 වර්ෂයෙන් පසුව දේපල තක්සේරුවක් සිදුකර නොතිබුණි. | වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2017 හා 2018 වර්ෂ වලදී දේපල තක්සේරු කර ගැනීම සඳහා ප්‍රධාන තක්සේරුකරු වෙත ඉල්ලීම් කර ඇති අතර, 2019 වර්ෂයේදී එම කාර්යය ඉටු කරන බව තක්සේරු දෙපාර්තමේන්තුව දන්වා ඇත. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2005 ජුනි 01 දිනැති අංක 2005/04 දරන "ඇතැම් ඉඩම් විකිණීම මත බදු අයකිරීම" සම්බන්ධයෙන් වූ සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02(iv) ඡේදය ප්‍රකාරව ගිවිසුම් ගතවීමෙන් තොරව ඉඩම් 06 ක් වෙන්දේසි කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ එවැනි ඉඩම් කට්ටිකර විකිණීමේදී විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹී ඇත. |

**3.4 අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇඹිලිපිටිය නගර මධ්‍යයේ පිහිටි ඔරලෝසු කණුවේ ඔරලෝසුව අළුත්වැඩියාව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව ඇස්තමේන්තු පිරිවැය වූ රු. 247,640 කට පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමක් හෝ ලංසු සුරක්ෂණයක් නොමැතිව 2017 මැයි 05 දින රු. 150,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණද, අළුත්වැඩියාව නිසි පරිදි සිදුකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඔරලෝසුව අක්‍රීයව පැවතුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවේ. | මේ සඳහා විවෘත මිල ගණන් කැඳවීමක් සිදුකර තිබුණද, කිසිවෙකුත් ඉදිරිපත් වී නොතිබුණු නිසා අදාල කොන්ත්‍රාත්කරු වෙත අළුත්වැඩියාව සිදුකරන ලෙස දන්වා රු. 150,000 ක අත්තිකාරම් මුදලක් ලබා දෙන ලදී.<br>එම ඔරලෝසුව අළුත්වැඩියා කිරීමෙන් පසුව නිවැරදිව වේලාව සටහන් වෙමින් තිබූ අතර, දින කිහිපයකට පසු නැවත අක්‍රීය විය. නැවතත් එය අළුත්වැඩියා කර දෙන ලෙස ලිපි කිහිපයක් මඟින් ඔහු වෙත දැන්වුවද, එම කාර්යය ඉටු නොකල හෙයින් ඉතිරි රු. 97,640 ක් ඔහු වෙත නොගෙවන ලදී. |
| (ආ) | 2007 වර්ෂයේදී එවකට සිටි සභාපතිනියගේ නමට ලියාපදිංචි කර තිබුණු යතුරුපැදියක් සභාවේ නමට පවරා නොතිබීම හේතුවෙන් 2008 වර්ෂයෙන් පසු ආදායම් බලපත්‍ර ලබා ගැනීමට නොහැකි වී තිබුණි. දීර්ඝ කාලයක් තිස්සේ අභාවිතව පැවතීම හේතුවෙන් අදාල යතුරුපැදිය ධාවනය කල නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. | යතුරුපැදියේ හිමිකම සභාව වෙත පවරාගෙන වත්කම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවේ. | ලියාපදිංචි සහතිකය අස්ථානගතවී ඇති බවට පොලිස් පැමිණිල්ලක් හිටපු සභාපතිනිය විසින් මෙම සභාවට ලබා දී ඇත. එම පොලිස් පැමිණිල්ල සමඟ යතුරුපැදිය ඇඹිලිපිටිය නගර සභාව වෙත පවරා ගැනීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 5,046,790 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් සාදා වියදම් සිදුකරන බවට වැඩිදුරටත් සඳහන් කරමි. |

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කර්මාන්ත දෙකක් සඳහා රු. 93,670 ක් වැඩිපුර ගෙවා තිබූ අතර, තවත් කර්මාන්තයක් සඳහා රු. 9,689 ක් ඉටු නොකල වැඩ වෙනුවෙන් ගෙවා තිබුණි. | කර්මාන්ත නිසි අධීක්ෂණයක් සිදුකළ යුතු අතර, වැඩිපුර ගෙවීම් අඩු කරගත යුතුවේ. | රඳවුම් මුදලින් අඩුකර ගැනීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 15 කට අදාලව එකතුව රු. 3,066,700 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඊලඟ වර්ෂයේ අයවැය පිළියෙල කිරීමේදී විචලනයන් අවම වන පරිදි ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 22 කට අදාලව එකතුව රු. 59,547,200 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 38 සිට සියයට 99.7 දක්වා පරාසයක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඊලඟ වර්ෂයේ අයවැය පිළියෙල කිරීමේදී විචලනයන් අවම වන පරිදි ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයේ පළමු කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවන ලද අතර, ඉදිරියේදී ඉතිරි කමිටු පවත්වනු ලබන බව දන්වා සිටිමි. |

**4.3 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ඇඹිලිපිටිය බස් නැවතුම්පලින් 2014 වර්ෂයේ සිට බස් රථ ගාල් කිරීමේ ගාස්තු අයකර නොතිබුණි. | සභාවට අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ආදායම් අයකර ගැනීම සම්බන්ධව ප්‍රධාන ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සමඟ මේ වනවිටත් සාකච්ඡා කරමින් පවතී. |
| (ආ) | 2014 පෙබරවාරි 21 දිනැති මහ සභා තීරණය අනුව හිඟ වරිපනම් එකතු කරන නිලධාරියාට 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු. 237,012 ක කොමිස් මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඉන් රු. 150,506 ක් ආපසු අය කරගත යුතුව පැවතුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් කඩිනමින් අයකරගත යුතුවේ. | මෙම කොමිස් මුදල ගෙවීමේදී වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු ගෙවන ලෙස ලිඛිතව දන්වා යවා ඇත. |